5/2/6/රන්බිම/චක්‍රලේඛ 2012.11.08

<u>චක්‍රලේඛ අංක - 2012/07</u>

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

<u>පරිගණක වැඩසටහනක් මඟින් රන්බිම දීමනාපත්‍ර මුද්‍රණය සිදු කිරීම.</u>

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ සිදු කරනු ලබන රන්බිම දීමනාපත්‍ර සකස් කිරීමේදී මතුවී තිබෙන ප්‍රායෝගික අපහසුතා හේතුවෙන් වාර්ෂිකව ලබා දීමට ඉලක්ක කරන දීමනාපත්‍ර ප්‍රමාණය ලබා දීම ගැටළුවක්ව පවතී. එමෙන්ම ඔබ විසින් සකස් කර එවන දීමනාපත්‍ර වල අඩුපාඩු හේතුවෙන් ඒවා නැවත ඔබ වෙත එවීමෙන් අදාළ ඉඩම් හිමියන් මෙන්ම ඔබ හා ඔබගේ කාර්ය මණ්ඩලය ද අසීරුතාවයට පත්වේ.

02. මෙම අපහසුතා මග හරවා ගැනීම සඳහා දීමනාපත්‍ර ලබාදීම කඩිනම් කිරීම අරමුණු කරගනිමින් ඒ සඳහා අවශ්‍ය පරිගණක වැඩසටහනක් සකස් කර ඇත. ඒ අනුව රන්බිම දීමනාපත්‍ර මුද්‍රණය මෙම දෙපාර්තමේන්තුවේදී සිදු කිරීමට කටයුතු යොදා ඇත.

03. මින් ඉදිරියට උක්ත පරිදි දීමනාපත්‍ර සකස් කිරීම සඳහා ඉල්ලුම් කිරීමේදී පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

04. මේ සමඟ එවා ඇති සංයුක්ත තැටියේ අඩංගු කර ඇති ගොණුව (File) විවෘත කර (MS Access මෘදුකාංගය මඟින්) එහි ඇති ආකෘතිය (Form) නිසි පරිදි සම්පූර්ණ කර නව සංයුක්ත තැටියක ගබඩා කර පහත සඳහන් ලේඛණද සමග පළාත් ඉඩම් කොමසාරිස්/ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්(අන්තර් පළාත්) මගින් මා වෙත එවීමට කටයුතු කරන්න. අදාළ තොරතුරු දෙමළ භාෂාවෙන් ලබා දෙන්නේ නම් එම තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් ද ලබා දීමට කටයුතු කළ යුතුවේ.

1. මිනින්දෝරු අධිකාරි විසින් සහතික කරන ලද ඉඩමට අදාළ රේඛා චිත්‍රයේ මුල් පිටපත.
2. නිසි පරිදි සම්පූර්ණ කරන ලද 1 ආකෘතිය.
3. නිසි පරිදි සම්පූර්ණ කරන ලද 11 ආකෘතිය.
4. බලපත්‍රයේ සහතික කළ පිටපත (2009.10.06 දින 5/2/6/රන්බිම චක්‍රලේඛය අනුව විධිමත් අනුමැතිය මත තෝරා ගන්නා ලද පුද්ගලයන් වෙත නිකුත් කරනු ලැබූ බවට සටහනක් අදාළ බලපත්‍රයේ වම් ඉහළ කෙළවරේ යොදා සහතික කර එවිය යුතුය)

5. ඉඩම සඳහා නිකුත් කළ මුල් බලපත්‍රය හෝ කාර්යාල පිටපත නොමැති විට ප්‍රාදේශීය ලේකම් විසින් පුද්ගලිකව පරීක්ෂා කර බලා නිර්දේශය සහිතව නිකුත් කරන ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව.
6. ලෙජරයේ සහතික කළ පිටපත.

05. ඉහත ලේඛණ හා සංයුක්ත තැටිය මා වෙත ලද පසු එම දීමනාපත්‍ර මුද්‍රණය කර ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යවා අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය සහ ප්‍රතිරූප අත්සන ලබා ගෙන ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කිරීම සඳහා ඔබ වෙත එවීමට මා විසින් කටයුතු කරනු ඇත.

06. තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් මෙම දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන සේවාවන් කාර්යක්ෂම කිරීමට ගනු ලබන මෙම උත්සාහය සඳහා ඔබගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතර මෙම චක්‍රලේඛය අනුව කටයුතු කිරීමේදී යම් ගැටළුවක් ඇති වන්නේ නම් ඒ පිළිබඳව මා වෙත දැනුම් දෙන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආර්. පී. ආර්. රාජපක්ෂ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් -
01. ජනාධිපති ලේකම් - කාරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
02. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කාරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
03. පළාත් ඉඩම් කොමසාරිස්වරු -
04. නි.ඉ.කො. / ස.ඉ.කො. (අන්තර් පළාත්) -

(03, 04) ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ලැබෙන ලේඛන හා සංයුක්ත තැටියේ අඩංගු තොරතුරු අනුව නිර්දේශය මා වෙත අප්‍රමාදව එවීමට.